**නියාගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද ෆෝටෝන් වීල්ඩ් ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පොදු වෙළඳපොල ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂය තුළදී දරන ලද රු.2,834,516 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය තුළ පුස්තකාල සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.5,210 ක පොත් ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, අපහරණය කරන ලද රු.14,219 ක පොත් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) ප්‍රධාන ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.15,136,403 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.22,461,680 ක් ලෙස දක්වා තිබීමෙන් ණයගැතියන් රු.7,325,277 කින් වැඩියෙන් දැක්විණි.

(ඉ) රු.9,872 ක් වූ සේවක ණය පොලී ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ලෙස දක්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් හා වේතන වියදම රු.4,731,627 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.4,722,136 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ වියදම් රු.9,491 කින් අඩුවෙන් දැක්විණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ පොදු පරිපාලන සැපයුම් හා උපකරණ වියදම රු.1,652,891 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,604,036 ක් ලෙස දක්වා තිබීමෙන් රු.48,855 කින් අදාල වියදම් අඩුවෙන් දැක්විණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළ වෙනත් උපයෝගී සේවා සැපයුම් හා උපකරණ වියදම රු.508,202 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.581,212 ක් ලෙස දැක්වීමෙන් රු.73,010 කින් අදාල වියදම් වැඩියෙන් දැක්විණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.2,885,540 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,875,450 ක් ලෙස දැක්වීමෙන් රු.1,010,090 කින් මුද්දර ගාස්තු ආදායම අඩුවෙන් දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.2,032,466 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,863,133 ක් ලෙස දැක්වීමෙන් රු.169,333 කින් ආදායම අඩුවෙන් දැක්විණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

(අ) ගිණුම් විෂයයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.9,800 ක වෙනසක් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 05 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපලේඛන අනුව ශේෂයන් අතර රු.312,802 ක වෙනසක් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.109,420,427 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු හා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි හා ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

(අ) ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා 03 ක් සඳහා සභාපතිවරයා හා සභිකයින් 07 දෙනෙකු වෙත රු.891,634 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එමෙන්ම විදේශගතවීමට විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219 වගන්තිය අනුව යම් ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයකුට හෝ සේවකයකුට ප්‍රාදේශීය සභාව සමග ඇති කරන ලද හෝ ක්‍රියාවේ යොදවන ලද යම් ගිවිසුමක හෝ වැඩක සම්බන්ධතාවක් හෝ මූල්‍ය සම්බන්ධතාවක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබිය යුතුය යනුවෙන් දක්වා තිබුණ ද, නියාගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු ප්‍රාදේශීය සභාව සමග සෘජුවම ගිවිසුම්වලට එළඹ තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු.1,299,322 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.832,556 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 වරිපනම් බදු

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.335,939 ක් වූ වරිපනම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 අක්කර බදු

-----------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.81,508 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 බදු කුලී

--------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.113,305 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 කඩකාමර බදුදීම

-------------------

කඩ කාමර 14 කින් සමන්විත තල්ගස්වල ගල්ලිද දෙමහල් වෙළඳ සංකීර්ණ ආර්ථික මධ්‍යස්ථානය නියාගම ප්‍රාදේශීය ලේකම් විසින් 2009 වර්ෂයේ දී සභාව වෙත පවරා තිබුණ ද, එකී කඩ කාමර විගණන දිනය වූ 2015 අගෝස්තු 13 තෙක් බදු දී නොතිබුණි. එමෙන්ම කඩ කාමර පිළිබඳව සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී කඩ කාමර 14 ම වසා දමා තිබූ බව ද නිරීක්ෂණය විය. මේ අනුව සභාවට ලබා ගැනීමට තිබූ ආදායම් වසර 06 ක් තුළ අහිමි වී තිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.100,817 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.871,000 ක උසාවි දඩ හා රු.4,831,584 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.3 අධිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.176,854 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභිකයින් 06 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ 2015 අගෝස්තු 14 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය සහ විශ්‍රාම ගිය සේවකයින් 05 දෙනෙකුගෙන් අයකර ගතයුතුව තිබූ රු.16,901 ක ණය ශේෂයක් 2006 වර්ෂයට පෙර සිට අයවීම් හිඟහිටව තිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය වත්කම්

------------------

ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය පිළිබඳ 2013 ජුනි 05 දිනැති අංක: PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ ආදිය 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණ ද, සභාව සතු ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හා කැබ් රථයක් සහා භූමියේ දිරාපත් වෙමින් පවතින බව 2015 අගෝස්තු 28 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**3.4 අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අත්පිට මුදලට ඉන්ධන ලබා ගැනීම**

---------------------------------------

සභාපතිවරයා විසින් පාවිච්චි කරන ලද කැබ් රථය සඳහා ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබා නොගෙන 2014 වර්ෂය තුළදී ඉන්ධන ලීටර් 3834 ක් අත්පිට මුදලට ලබාගෙන බිල්පත් ඉදිරිපත් කර රු.460,087 ක් සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

සභාව සතු වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් ද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ඉන්ධන සපයා ගැනීමේ පදනම මත වාහනයක් ලබා ගැනීම**

-----------------------------------------------------------------

පෞද්ගලික පාර්ශවයකට අයත් වාහනයක් සභාවෙන් ඉන්ධන සපයා ගැනීමේ පදනම මත ලබාගෙන 2014 ජුනි 14 දින සිට සැප්තැම්බර් 08 දින දක්වා වූ කාලය තුළ සභාපතිවරයා විසින් පාවිච්චි කර තිබූ අතර එකී කාලය තුළ ඉන්ධන ලීටර් 1150 ක් වාහනයට යෙදවීම වෙනුවෙන් රු.185,880 ක් සභා අරමුදල් වැයකර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාවේ කටයුතු සඳහා ඉහත පරිදි පෞද්ගලික වාහනයක් ලබාදීමට හේතු වූ කරුණු විගණනයට අනාවරණය නොවීය.

(ii) මෙම වාහනය සඳහා ඉන්ධන ලබා ගැනීමේ දී ඉන්ධන ඇණවුම් භාවිතා කර නොතිබූ අතර සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ බිල්පත් මත අදාළ මුදල් ඔහුට ගෙවා තිබුණි. එමෙන්ම අදාළ කාලපරිච්ඡේදය තුළදී වාහනයට යොදන ලද ඉන්ධන ලීටර් 1150 සම්බන්ධයෙන් ධාවනය කිරීම් තහවුරු කිරීම සඳහා ධාවන සටහන් ලියා තබා නොතිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සභා බලප්‍රදේශය තුළ පිහිටි පිටිගල මහවත්ත ඉඩමෙහි අක්කර 1 ½ ක ප්‍රදේශයක් 2006 වර්ෂයේ සිට කසළ බැහැර කිරීම සඳහා යොදාගෙන තිබුණි. පිළිසරු ව්‍යාපෘතිය මගින් 2007 වර්ෂයේ සිට 2012 දක්වා රු.5,098,338 ක් වැයකර කොම්පෝස්ට් අංගනයක් ඉදිකර තිබූ අතර දිනකට ටොන් 3.5 ක කසළ එක්රැස් කර එමගින් දිනකට කි.ග්‍රෑ.200 ක කොම්පෝස්ට් නිෂ්පාදනයක් කර තිබූ බව අනාවරණය විය. විගණන දිනය වූ 2015 අගෝස්තු 24 දින වනවිට ඉඩමට කසළ ගෙන ඒම නවතා තිබූ අතර කොම්පෝස්ට් නිෂ්පාදනය 2015 ජුනි 19 දින සිට නතර කර තිබුණි. එමෙන්ම අමතර පිරිවැයක් දරමින් කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශය වෙත කසළ බැහැර කිරීමට කටයුතු කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය